# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,517 — 1965 සැප්තැම්බර් 30 වැනි බ්‍රහස්පතින්ද — 1965.9.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වන කොටස: (I) වන ඡෙදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## ආණ්ඩුවේ නිවේදන

### මිළ පාලන පනත

පහත සඳහන් උපලේඛනයේ දක්වෙන නියෝග මවිසින් අනුමත කරනු ලැබූ බව (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වැනි වගන්තියේ 7 වෙනි උපවගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

1965 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දීය.

#### උපලේඛනය

| නියෝගයේ දිනය | නියෝගය නිකුත්කළ නිලධාරි | නියෝගය අදාල ද්‍රව්‍ය | නියෝගය පලකරන ලද ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 1965.8. 3 | කෑගල්ල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය—මසූර් පරිප්පු | 1965.8.7 දින අංක 14,473 |
| 1965.8 3 | පුත්තලම් දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක | හරක්මස් | එම |
| 1965.8.10 | මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය—මසූර් පරිප්පු | 1965.8.14 දින අංක 14,482 |
| 1965.8.12 | නුවරඑළිය දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක | මසූර් පරිප්පු | 1965.8.19 දින අංක 14,485 |
| එම | එම | සක්කරා | එම |
| එම | එම | අතිරේක ආහාර ද්‍රව්‍ය | එම |
| 1965.8.26 | මිල පාලක ආහාර | කිරි (ආහාර) | 1965.8.27 දින අංක 14,492 |

9–203

---

එල්. ඩී. බී.—80/44.

### පඩිපාලක සභා ආඥපනත

#### නිවේදනයයි

පඩිපාලක සභා ආඥපනතේ (136 පරිච්ඡෙදය) 20 (2) (ඩී) යන වගන්තිය සටතේ ඇමතිවරයා විසින් වර්ෂ 1944 නොවැම්බර් 3 දින අංක 9.327, වර්ෂ 1946 අගෝස්තු 16 දින අංක 9,591, වර්ෂ 1947 මාර්තු 21 දින අංක 9.683, වර්ෂ 1948 දෙසැම්බර් 10 දින අංක 9,928, වර්ෂ 1949 අප්‍රේල් 1 දින අංක 9.963, වර්ෂ 1950 ජුනි 2 දින අංක 10.108, වර්ෂ 1953 ජුනි 25 දින අංක 10.541, වර්ෂ 1958 ඔක්තෝබර් 27 දින අංක 11,568, වර්ෂ 1961 ජුලි 7 දින අංක 12.508, වර්ෂ 1962 ජුනි 22 දින අංක 13.179, වර්ෂ 1963 පෙබරවාරි මස 22 දින අංක 13.529 යන ගැසට් පත්‍රයන්හි පළ කරන ලද නිවේදන මාර්ගයෙන් නියම බලධරයා ලෙස පත්කරනු ලැබූ ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ කැන්පත් ආතර් රාජකුමාර් රත්නවේල් වන මම, මෙහි දක්වෙන උපලේඛනයෙහි සඳහන් එක් එක් ව්‍යාපාරයෙහි නියුක්ත සේවකයින් කෙරෙහි, වර්ෂ 1965 සැප්තැම්බර් මස තුළ ගෙවිය යුතු කළ හැකි ජීවන වියදම් දර්ශකාංකය 112·0 වන බව මෙයින් ප්‍රකාශ කරමි.

1965 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ 7 හි අංක 563 දරණ
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේදී ය.

ඒ. ආර්. රත්නවේල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.


1411——ආර් 9344—7,075 (65/9)

උපලේඛනය

1. ඉංජිනේරු ව්‍යාපාරය
2. මුද්‍රණ ව්‍යාපාරය
3. තේ පිටරට යැවීමේ ව්‍යාපාරය
4. රබර් පිටරට යැවීමේ ව්‍යාපාරය
5. මෝටර් රථ ගමනාගමන ව්‍යාපාරය
6. ගිනි පෙට්ටි සෑදීමේ ව්‍යාපාරය
7. සිනමා (චිත්‍රපට) ව්‍යාපාරය
8. නෞකාගාර, නැව්තොට හා වරාය ගමනාගමන ව්‍යාපාරය.
9. ගොඩනැගිලි ව්‍යාපාරය
10. තේ වැවීමේ සහ සෑදීමේ ව්‍යාපාරය
11. කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ සෑදීමේ ව්‍යාපාරය
12. රබර් වැවීමේ සහ සෑදීමේ ව්‍යාපාරය
13. පොල් වැවීමේ ව්‍යාපාරය
14. පොල් සෑදීමේ ව්‍යාපාරය
15. මිනිරන් ව්‍යාපාරය
16. බේකරි ව්‍යාපාරය
17. ගඩොල් හා උළු සෑදීමේ ව්‍යාපාරය
18. ගුදිරි කොහු හා ඇට කෙදි කොහු පිටරට යැවීමේ ව්‍යාපාරය
19. අයිස් සහ සිසිල් බීම සෑදීමේ ව්‍යාපාරය

## තේ වැවීම හා සෑදීම, රබර් වැවීම හා සෑදීම, කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීම හා සෑදීම, පොල් වැවීම, පොල් සෑදීම, මිනිරන්, ඉංජිනේරු, මුද්‍රණ, මෝටර් රථ ගමනාගමන, තේ පිටරට යැවීම, රබර් පිටරට යැවීම, ගිනි පෙට්ටි සෑදීම, චිත්‍රපට (සිනමා), නෞකාගාර, නැව් තොට හා වරායයන්හි ගමනාගමනය, ගොඩනැගිලි, බේකරි, ගඩොල් හා උළු සෑදීම, ගුදිරි කොහු හා ඇට කෙදි කොහු පිටරට යැවීම හා අයිස් හා සිසිල්බීම සෑදීමේ යන කර්මාන්තවල නියුක්ත වැඩකරුවන්හට ගෙවිය යුතු විශේෂ දීමනා

ඉහත සඳහන් කර්මාන්ත සඳහා, 1965 සැප්තැම්බර් මාසයේ ජීවන වියදම් අංකය 112·0 වන නිසා, ඒ ඒ අවස්ථාවේ හැටියට, 1965 ඔක්තෝබර් මාසය වෙනුවෙන් හෝ 1965 ඔක්තෝබර් මාසයේ සාමාන්‍ය වැඩ කරන දිනයක් වෙනුවෙන් හෝ ගෙවිය යුතු විශේෂ දීමනාව, පහත දක්වෙන ආකාරයට බැව් (136 වැනි පරිච්ඡේදය වන) පඩි පාලක සභා ආඥාපනතේ 20 (2) (ඇ) යන වගන්තිය යටතේ, මෙයින් නිවේදනය කරනු ලැබේ :—

1. තේ වැවීම හා සෑදීම, රබර් වැවීම හා සෑදීම, කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීම හා සෑදීම යන කර්මාන්ත :

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| වයස අවුරුදු 16කට අඩු නැති පිරිමි වැඩකරුවකුට ... ... ... | 1 30 |
| වයස අවුරුදු 15කට අඩු නැති ගැහැණු වැඩකාරියකට ... ... ... | 0 96 |
| ළමා වැඩකරුවකුට ... ... ... ... ... | 0 89 |

2. පොල් වැවීමේ කර්මාන්තය:

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| වයස අවුරුදු 16කට අඩු නැති පිරිමි වැඩකරුවකුට (කංකානම ද ඇතුළුව) ... ... | 1 30 |
| වයස අවුරුදු 15කට අඩු නැති ගැහැණු වැඩකාරියකට ... ... ... | 0 96 |
| වයස අවුරුදු 16කට අඩු පිරිමි වැඩකරුවකුට හෝ වයස අවුරුදු 15කට අඩු ගැහැණු වැඩකාරියකට .. | 0 89 |

3. පොල් සෑදීමේ කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| වයස අවුරුදු 18කට අඩු නැති පිරිමි වැඩකරුවකුට (කංකානම ද ඇතුළුව) ... .. | 2 15 |
| වයස අවුරුදු 18කට අඩු නැති ගැහැණු වැඩකාරියකට ... ... ... | 1 76 |
| වයස අවුරුදු 18කට අඩු (ස්ත්‍රී පුරුෂ භේදය නොසළකා) වැඩකරුවකුට ... ... | 1 69 |

4. මිණිරන් කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| විකිණිය හැකි මිණිරන් ශුද්ධ කිරීම හා සකස් කිරීම පිළිබඳ වැඩවල යෙදී සිටින අය නොවන වැඩකරුවෝ— | |
| වයස අවුරුදු 18කට අඩු නැති පිරිමි වැඩකරුවකුට ... ... ... | 1 36 |
| වයස අවුරුදු 18කට අඩු නැති ගැහැණු වැඩකාරියකට ... ... ... | 1 00 |
| වයස අවුරුදු 18කට අඩු (ස්ත්‍රී පුරුෂ භේදයක් නොසලකා) වැඩකරුවකුට ... ... | 0 93 |
| විකිණිය හැකි මිණිරන් ශුද්ධ කිරීම හා සකස් කිරීම පිළිබඳ වැඩවල යෙදී සිටින වැඩකරුවෝ— | |
| වයස අවුරුදු 18කට අඩු නැති පිරිමි වැඩකරුවකුට ... ... ... | 1 16 |
| වයස අවුරුදු 18කට අඩු නැති ගැහැණු වැඩකාරියකට ... ... ... | 1 20 |
| වයස අවුරුදු 18කට අඩු (ස්ත්‍රී පුරුෂ භේදයක් නොසලකා) වැඩකරුවකුට ... ... | 1 13 |

5. ඉංජිනේරු කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| අදක්ෂ/නුපුහුණු කම්කරුවෝ ... ... ... ... ... | 2 18 |
| අර්ධ වශයෙන් පුහුණු කම්කරුවෝ, 1 වන සහ II වන වර්ගය, පුහුණු කම්කරුවෝ, කංකානිහු හා මුරකරුවෝ ... ... ... ... ... | 2 28 |
| කර්මාන්ත ඉගෙන ගන්නෝ හා වැඩ පුරුදු වන්නෝ— | |
| 1 වන අවුරුද්ද ... ... ... ... ... | 1 16 |
| 2 වන අවුරුද්ද ... ... ... ... ... | 1 26 |
| 3 වන අවුරුද්ද ... ... ... ... ... | 1 60 |
| 4 වන අවුරුද්ද ... ... ... ... ... | 1 75 |

6. මුද්‍රණ කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | මාසයට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| වැඩ ඉගෙන ගන්නන් හා වැඩ පුරුදු වන්නන් නොවන වැඩකරුවෝ— | |
| "ඒ" පන්තිය ... ... ... ... ... | 108 42 |
| "බී" පන්තිය ... ... ... ... ... | 86 92 |
| "සී" පන්තියේ I වන වර්ගය ... ... ... ... | 76 17 |
| "සී" පන්තියේ II වන වර්ගය ... ... ... ... | 70 68 |
| "ඩී" පන්තිය ... ... ... ... ... | 65 42 |
| "ඊ" පන්තිය ... ... ... ... ... | 62 79 |
| "එෆ්" පන්තිය ... ... ... ... ... | 41 77 |
| "ජී" පන්තිය ... ... ... ... ... | 65 42 |

| වැඩකරුවාගේ පන්තිය | මාසයකට ලැබියයුතු විශේෂ දීමනාව | | | | |
|---|---|---|---|---|---|
| | 1 වැනි අවුරුද්ද රු. ශ. | 2 වැනි අවුරුද්ද රු. ශ. | 3 වැනි අවුරුද්ද රු. ශ. | 4 වැනි අවුරුද්ද රු. ශ. | 5 වැනි අවුරුද්ද රු. ශ. |
| වැඩ ඉගෙන ගන්නෝ හා වැඩ පුරුදු වන්නෝ— | | | | | |
| "ඒ" පන්තිය ... ... ... | 45 72 ... | 54 82 ... | 63 92 ... | 77 32 ... | 91 22 |
| "බී" පන්තිය ... ... ... | 39 27 ... | 52 67 ... | 59 62 ... | 69 68 ... | — |
| "සී" පන්තියේ I වන වර්ගය ... ... | 41 42 ... | 47 18 ... | 53 17 ... | 61 79 ... | — |
| "සී" පන්තියේ II වන වර්ගය ... ... | 39 27 ... | 44 55 ... | 49 83 ... | 57 61 ... | — |
| "ඩී" පන්තිය ... ... ... | 37 12 ... | 41 92 ... | 46 72 ... | 53 67 ... | — |

7. මෝටර් රථ ගමනාගමන කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | විශේෂ දීමනාව | |
|---|---|---|
| | මාසයට රු. ශ. | සාමාන්‍ය වැඩ කරන දිනයකට රු. ශ. |
| "ඒ", "බී", "ඩී" හා "එෆ්" යන පන්ති ... ... ... ... | 65 42 ... | 2 77 |
| "සී" පන්තිය ... ... ... ... ... | 62 92 ... | 2 77 |
| "ඊ" පන්තිය ... ... ... ... ... | 60 42 ... | 2 52 |
| "ජී" හා "එච්" පන්ති ... ... ... ... ... | 61 12 ... | 2 77 |
| "කේ" පන්තිය ... ... ... ... ... | 50 92 ... | 1 91 |
| "අයි" හා "ජේ" පන්ති ... ... ... ... ... | 61 12 ... | — |

**8. තේ පිටරට යැවීම හා රබර් පිටරට යැවීම පිළිබඳ කර්මාන්ත :**

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| (ඒ) වයස අවුරුදු 18ට අඩු නැති පිරිමි වැඩකරුවෝ— | |
| II වන වර්ගය ... ... ... ... ... | 2 18 |
| මධ්‍යම වර්ගය, I වැනි වර්ගය, පෙට්ටි සාදන්නෝ හා කැඩුණු පෙට්ටි අළුත්වැඩියා කරන්නෝ (තේ පිටරට යැවීම පිළිබඳ කර්මාන්තය සම්බන්ධයෙන් පමණයි) සහ මුරකරුවෝ ... ... ... ... ... | 2 28 |
| (බී) වයස අවුරුදු 18ට අඩු නැති ගැහැණු වැඩකාරියෝ ... ... ... | 2 06 |
| (සී) වයස අවුරුදු 18ට අඩු (ස්ත්‍රී පුරුෂ භේදයක් නොසළකා) වැඩකරුවෝ— | |
| වයස අවුරුදු 14ට වැඩි වූ සහ වයස අවුරුදු 15ට අඩු වූ විට ... ... | 1 63 |
| වයස අවුරුදු 15ට වැඩි වූ සහ වයස අවුරුදු 16ට අඩු වූ විට ... ... | 1 68 |
| වයස අවුරුදු 16ට වැඩි වූ සහ වයස අවුරුදු 17ට අඩු වූ විට ... ... | 1 73 |
| වයස අවුරුදු 17ට වැඩි වූ සහ වයස අවුරුදු 18ට අඩු වූ විට ... ... | 1 83 |

**9. ගිනිපෙට්ටි සෑදීමේ කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව | |
|---|---|---|
| | පුරුෂයින්ට රු. ශ. | ස්ත්‍රීන්ට රු. ශ. |
| (ඒ) වැඩිහිටි අය (වයස අවුරුදු 18ට සහ ඊට වැඩි)— | | |
| I වන හා II වන වර්ග ... ... ... ... | 1 91 ... | 1 81 |
| III වන වර්ගය ... ... ... ... | 1 81 ... | 1 69 |
| IV වන වර්ගය ... ... ... ... | 1 91 ... | — |

| | ස්ත්‍රී පුරුෂ භේදයක් නොසළකා රු. ශ. |
|---|---|
| (බී) තරුණ අය— | |
| I වන හා II වන වර්ග—වයස අවුරුදු 14ට වැඩි වූ සහ අවුරුදු 18ට අඩු වූ විට ... | 1 46 |
| III වන වර්ගය—වයස අවුරුදු 16 සහ ඊට වැඩි එහෙත් අවුරුදු 18ට අඩු වූ විට ... | 1 46 |
| වයස අවුරුදු 14ට වැඩි එහෙත් අවුරුදු 16ට අඩු වූ විට ... | 1 21 |

**10. චිත්‍රපට (සිනමා) කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | මාසයට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| ඒ.—ලිපිකාර නොවූ— | |
| අදක්ෂ/නුපුහුණු වැඩකරුවෝ ... ... ... ... | 56 56 |
| අර්ධ වශයෙන් පුහුණු වැඩකරුවෝ ... ... ... ... | 59 16 |
| පුහුණු වැඩකරුවෝ, I වන සහ II වන වර්ග ... ... ... | 60 98 |
| බී.—ලිපිකාර— | |
| III වන වර්ගය ... ... ... ... ... | 55 00 |
| II වන වර්ගය ... ... ... ... ... | 58 00 |
| I වන වර්ගය ... ... ... ... ... | 63 00 |

**11. නෞකාගාර, නැව්තොට හා වරායයන්හි ගමනාගමන කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | මාසයට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| බර වැඩ— | |
| විශේෂ වර්ගය ... ... ... ... ... | 37 00 |
| පුහුණු වර්ගය ... ... ... ... ... | 33 00 |
| අර්ධ වශයෙන් පුහුණු වර්ගය, අදක්ෂ/නුපුහුණු I වන හා II වන වර්ග සහ ගැහැණු වැඩකාරියෝ ... | 30 00 |
| බර වැඩ නොවන වැඩ— | |
| විශේෂ වර්ගය ... ... ... ... ... | 44 00 |
| I වන වර්ගය ... ... ... ... ... | 33 00 |

**12. ගොඩනැගිලි කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| අදක්ෂ/නුපුහුණු කම්කරුවෝ ... ... ... ... ... | 2 18 |
| අර්ධ වශයෙන් පුහුණු II වන වර්ගය, අර්ධ වශයෙන් පුහුණු I වන වර්ගය හා පුහුණු වැඩකරුවෝ ... | 2 28 |

**13. බේකරි කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | මාසයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| " ඒ " පන්තියේ වැඩකරුවෙකුට ... ... ... ... ... | 63 70 |
| " බී " පන්තියේ වැඩකරුවෙකුට ... ... ... ... ... | 58 75 |
| " සී " පන්තියේ වැඩකරුවෙකුට ... ... ... ... ... | 44 77 |

ගඩොල් සහ උළු සෑදීමේ කර්මාන්තය :

| කම්කරුවාගේ පන්තිය | | | | | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව<br>රු. ශ. |
|---|---|---|---|---|---|
| " ඒ " වයස අවුරුදු 18ට නොඅඩු පිරිමි කම්කරුවෝ— | | | | | |
| පුහුණු කම්කරුවෝ I හා II වන වර්ගය හා අර්ධ වශයෙන් පුහුණුවූ කම්කරුවෝ | | | ... | ... | 2 06 |
| නුපුහුණු (අදක්ෂ) කම්කරුවෝ | ... | ... | ... | ... | 1 96 |
| " බී " වයස අවුරුදු 18ට නොඅඩු ගැහැණු කම්කරුවෝ | | ... | ... | ... | 1 85 |
| " සී " වයස අවුරුදු 18ට අඩු කම්කරුවෝ (ස්ත්‍රී/පුරුෂ භේදයක් නොසළකා)— | | | | | |
| වයස අවුරුදු 14ට වැඩි එහෙත් 15ට අඩු | ... | ... | ... | ... | 1 46 |
| වයස අවුරුදු 15ට වැඩි එහෙත් 16ට අඩු | ... | ... | ... | ... | 1 51 |
| වයස අවුරුදු 16ට වැඩි එහෙත් 17ට අඩු | ... | ... | ... | ... | 1 56 |
| වයස අවුරුදු 17ට වැඩි එහෙත් 18ට අඩු | ... | ... | ... | ... | 1 66 |

15. ඉදිරි කොහු සහ ඇට කෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය :

| කම්කරුවාගේ පන්තිය | | | | | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව<br>රු. ශ. |
|---|---|---|---|---|---|
| " ඒ " වයස අවුරුදු 18ට නොඅඩු පිරිමි කම්කරුවෝ— | | | | | |
| II වැනි ශ්‍රෙණිය, කම්කරුවෝ | ... | ... | ... | ... | 2 18 |
| පළමුවන ශ්‍රෙණි කම්කරුවෝ හා මධ්‍යම ශ්‍රෙණි කම්කරුවෝ හා බෙල් කරන යන්ත්‍රයේ ප්‍රධාන ක්‍රියාකරවන්නා ... | ... | ... | ... | ... | 2 28 |
| " බී " වයස අවුරුදු 18ට නොඅඩු කම්කරු ස්ත්‍රීන් ... | | ... | ... | ... | 2 06 |
| " සී " වයස අවුරුදු 18ට අඩු (ස්ත්‍රී/පුරුෂ භේදයක් නොමැතිව) කම්කරුවෝ— | | | | | |
| වයස අවුරුදු 14ට වැඩි එහෙත් 15ට අඩු | ... | ... | ... | ... | 1 63 |
| වයස අවුරුදු 15ට වැඩි එහෙත් 16ට අඩු | ... | ... | ... | ... | 1 68 |
| වයස අවුරුදු 16ට වැඩි එහෙත් 17ට අඩු | ... | ... | ... | ... | 1 73 |
| වයස අවුරුදු 17ට වැඩි එහෙත් 18ට අඩු | ... | ... | ... | ... | 1 83 |

16. අයිස් හා සිස්ල්බීම සෑදීමේ කර්මාන්තය :

| කම්කරුවාගේ පන්තිය | | | | | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව<br>රු. ශ. |
|---|---|---|---|---|---|
| I වැනි හා II වැනි ශ්‍රෙණියේ කම්කරුවෝ | ... | ... | ... | ... | 2 28 |
| III වැනි ශ්‍රෙණියේ කම්කරුවෝ ... | ... | ... | ... | ... | 2 18 |

1965 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දීය.

එන්. එල්. අබයවීර,
කම්කරු කොමසාරිස්.

9-244/1

---

## අඩුම වැටුප් (ඉන්දියානු කම්කරු) ආඥපනතේ විධිවිධාන (135 වන පරිච්ඡේදය) යටතේ සැලකෙන්නාවූත්, කම්කරු පඩි සභා තීරණ අදාල නොවන්නාවූත් කම්කරුවනට ගෙවිය යුතු ජීවනාධාර මුදල

අඩුම වැටුප් (ඉන්දියානු කම්කරු) ආඥපනතේ විධිවිධාන යටතේ සැලකෙන්නාවූත්, කම්කරු පඩි සභා ආඥපනත යටතේ නියමිත අඩුම වැටුප් ගෙවිය යුතු නොවන්නාවූත් කම්කරුවකුට 1965 සැප්තැම්බර් මාසයේ වැඩ කරන එක් එක් දවසකට ගෙවිය යුතු ජීවනාධාර මුදල සියලුදෙනාගේම දැන ගැනීම පිණිස මෙහි පහත පළ කරනු ලැබේ :—

| | | | උඩ රට<br>ශත | | මැදි රට<br>ශත | | පහත රට<br>ශත |
|---|---|---|---|---|---|---|---|
| පිරිමි කම්කරුවකුට | ... | ... | 88 | ... | 85 | ... | 62 |
| කම්කරු ස්ත්‍රියකට | ... | ... | 71 | ... | 68 | ... | 66 |
| ළමා කම්කරුවකුට | ... | ... | 71 | ... | 68 | ... | 66 |

වත්තක් උඩරට, මැදිරට හෝ පහතරට යනුවෙන් සැලකෙන්නේ වර්ෂ 1940 දෙසැම්බර් මස 23 වන දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1940 දෙසැම්බර් මස 21 වන දින අංක 281 දරණ නිවේදනයේ පෙන්නා ඇති පරිද්දෙනි.

එන්. එල්. අබයවීර,
කම්කරු කොමසාරිස්.

වර්ෂ 1965 සැප්තැම්බර් මස 30 දින,
කොළඹ දීය.

9-244/2

# මිළ පාලන දැන්වීම්

**ඇප්සී/වී—ඇස්ඇප්—1 (47) අංකය දරන ආහාර මිළ ආඥාව** — **අතිරේක ආහාර ද්‍රව්‍ය**

## මිල පාලන පනත

### ආඥාව

(173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 (2) වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් ඒරම්බමූර්ති සුන්දරමූර්ති වන මම, මේ ආඥාවෙන්—

(i) 1965 සැප්තැම්බර් 14 වන දින අංක 14,506 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ 1965.9.11 වන දින අංක ඇප්සී/වී—ඇස්ඇප් 1 (46) දරන ආහාර මිළ ආඥාව, වහාම බල පැවැත්වෙන පරිදි අවලංගු කරමි.

(ii) මෙහි වූ උපලේඛනයේ 3 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිළ පාලන පනත යටතේ කොළඹ මහ නගර සහා ප්‍රදේශය තුළ තොග වෙළෙන්දකු විසින් විකිණිය හැකි උපරිම තොග මිළ ලෙස එවකට නියම කර ඇති මිළ ඒ උපලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ දළ බර හොණ්ඩරයක් ඒ උපලේඛනයේ 2 වන තීරයෙහි නිශ්චිතව සඳහන් පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම තොග මිළ විය යුතු ලෙස, වහාම බල පැවෙත්වෙන පරිදි නියම කරමි.

(iii) මෙහි වූ උපලේඛනයේ 4 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිළ පාලන පනත යටතේ කොළඹ මහ නගර සහා ප්‍රදේශය තුළ සිල්ලර වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම සිල්ලර මිළ ලෙස එවකට නියම කර ඇති මිළ, ඒ උපලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ ශුද්ධ බර රාත්තලක් ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම සිල්ලර මිළ විය යුතු ලෙස, වහාම බලපැවැත්වෙන පරිදි නියම කරමි.

(iv) මෙම ආඥාවේ කාර්යය සඳහා—

(අ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයක යම් ප්‍රමාණයක් නැවත විකිණීමේ කාර්‍ය්‍ය සඳහා වූ යම් විකිණීමක් හෝ ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් වූ යම් විකිණීමක් තොග වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත් ;

(ආ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස දළබර හොණ්ඩරයකට අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත්, නියම කරමි.

(v) මෙම ආඥාවෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිම තැනැත්තකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(vi) මෙම ආඥාවෙන් උපරිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ වාහනයක හෝ මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින්ම ඒ ද්‍රව්‍යයෙන් ප්‍රමාණවත් කොටසක් සුදුසු භාජනයක බහා එම ද්‍රව්‍ය සඳහා මෙම ආඥාවෙන් නියමිත උපරිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ ප්‍රවකයක හෝ මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එකී ද්‍රව්‍යය සහ ඒ සඳහා නියම්කරන ලද උපරිම මිළ යම් ගනුදෙනු කරුවකුට පැහැදිලිව පෙනෙන සේ ඒ ස්ථානයෙහි හෝ වාහනයෙහි ප්‍රදර්ශනය කළයුතු බව නියම කරමි.

(vii) මෙම ආඥාවේ කාර්යය සඳහා " රාත්තල " හෝ " රා. " යන්නෙන් ඇව්ර්පොදුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර සැලකිය යුතු බව නියම කරමි.

(viii) මෙම ආඥාවෙන් උපරිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම ගැනුම්කරු ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය, එනම් විකිණීම තොග වශයෙන් ද, නැතහොත් සිල්ලර වශයෙන් ද යන බව ඇතුළත් කුවිතාන්සියක් ගැනුම් කරුට දිය යුතු බව නියම කරමි.

(ix) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණූ විට, ඒ විකුණනු ලැබූ ද්‍රව්‍යය යම් දෙයක ඔතනු ලැබේ නම් නැතහොත් බහාලනු ලැබේ නම්, එහි මිළත් ඒ උපලේඛනයේ 3 වන සහ 4 වන තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත් විය යුතු බව නියම කරමි.

1965 සැප්තැම්බර් මස 21 වන දින පස්වරු 1 ට කොළඹ කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ඒරම්බමූර්ති සුන්දරමූර්ති,
කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

### උපලේඛනය

| 1 වන තීරය<br>ද්‍රව්‍යය | 2 වන තීරය<br>ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය, කොළඹ දිස්ත්‍රික්කය (කොළඹ නාගරික සීමාවෙන් පිට) | 3 වන තීරය<br>තොග වෙළෙන්දකු විසින් දළ බර හොණ්ඩරයක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිළට වඩා වැඩි අධිකය<br>රු. ශ. | 4 වන තීරය<br>සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිළට වඩා වැඩි අධිකය<br>රු. ශ. |
|---|---|---|---|
| 1. ඇනු (රතුඇනු හා වික්බෙල්පූර් හැර වෙනත් සියලුම) | ... | 1 60 | 0 02 |
| 2. අර්තාපල් | ... | 1 60 | 0 02 |
| 3. සුදුරු | ... | 2 60 | 0 03 |
| 4. කහ | ... | 2 60 | 0 03 |
| 5. කොත්තමල්ලි | ... | 2 60 | 0 03 |
| 6. පියළි නොකළ උළුඳු | ... | 2 60 | 0 03 |
| 7. මුංඇට | ... | 2 60 | 0 03 |
| 8. තෝර පරිප්පු | ... | 2 60 | 0 03 |
| 9. කඩල පරිප්පු | ... | 2 60 | 0 03 |
| 10. වික් පිස් | ... | 2 60 | 0 03 |
| 11. සුදුඇණු (බොම්බේ) | ... | 2 60 | 0 03 |
| 12. සියඹලා | ... | 2 60 | 0 03 |
| 13. සක්කර | ... | 2 60 | 0 03 |
| 14. රතු ඇනු | ... | 2 60 | 0 03 |

සැලකිය යුතුය.—මේ මිළ ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු ලෙස නියමකර ඇති මිළ නොවේ. ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ වන අතර ඊට ඉහළින් ඒ ද්‍රව්‍ය නොවිකිණිය යුතුය.

9–176

ලංකාවේ වලව්වේතයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්"හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි